**කින්නියා ප්‍රාදේශීය සභාව**
**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2019 ජුලි 03 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 අගෝස්තු 07 දින ද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 නොවැම්බර් 06 දින ද සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,2018 දෙසැම්බර් 31 දිනට කින්නියා ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සේවක ණය ලේඛනය අනුව සේවක ණය ශේෂය රු.1,723,232 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල සේවක ණය ශේෂය රු.1,816,183 ක් ලෙස දක්වා තිබුණි. මේ අනුව සේවක ණය ශේෂය රු.92,951 කින් වැඩියෙන් දක්වා තිබුණි. | සේවක ණය ලේඛනය විධිමත් ලෙස පවත්වාගෙන යා යුතුය. | මූල්‍ය ප්‍රකාශනවල අදාළ වටිනාකම වැරදීමකින් වැඩියෙන් දක්වා ඇත. මෙම වටිනාකම 2019 අවසන් ගිණුම් වාර්තාවේ ගලපනු ලැබේ. |

### 1.3.2 ගෙවිය යුතු ගිණුම්
----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| රු.2,227,497 ක් වූ විශ්‍රාම වැටුප් දායක ශේෂය ගෙවා නිරවුල් කිරීමට කටයුතු නොකර වර්ෂ 10 ක් දක්වා මූල්‍ය ප්‍රකාශන ශේෂයක් ලෙස දක්වමින් පැවතුණි. | විශ්‍රාම වැටුප් දායක මුදල් ගෙවා අවසන් කළ යුතුය. | 2006.04.15 දින කින්නියා ප්‍රාදේශීය සභාව, නගර සභාවක් බවට උසස් කරනු ලැබූ අතර, කින්නියා ප්‍රාදේශීය සභාව අලුතින් පිහිටුවන ලදී. අලුතින් ස්ථාපිත කිරීමට පෙර කාලපරිච්ඡේදයේ පැවති මෙම හිඟ ශේෂ කින්නියා ප්‍රාදේශීය සභාවට අයිති බවට දක්වා තිබුණි. මේ පිළිබඳව, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් තොරතුරු විමසීම් කර ඇත. ලැබූ වහාම ඉදිරියේදී මෙය ගලපනු ලැබේ. |

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම
------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ස්ථාවර වත්කම් ලේඛනය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනය විගණනයට ඉදිරිපත් කළ යුතුය. | අදාළ නිලධාරියාට අඛණ්ඩව පවත්වාගෙන යාමට උපදෙස් ලබා දී ඇත. |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති. රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 173 වගන්තිය | සභාව විසින් සිදුකරනු ලබන සියළුම සැපයුම් හා සේවාවන් සඳහා ගිවිසුම්වලට එළඹිය යුතු බවට සඳහන් කර තිබුණද, සභාව විසින් 2017 සහ 2018 වර්ෂවලදී කුලියට ලබාදුන් මස් කඩ 06 ක් සහ මාළු වෙළඳසැල සඳහා ගිවිසුම් අවසන් කර නොතිබුණි. | ගිවිසුම් අත්සන් කර කඩ කාමර ලබාදිය යුතුය. | 2018 වර්ෂයේදී ලබාදුන් මස් කඩ 06 ක් සඳහා මාළු වෙළඳසැල සඳහා ගිවිසුම් අත්සන් කර ඇත. |
| (ආ) | මෝටර් රථ ප්‍රවාහන පනතේ 203 වගන්තිය | සෑම වර්ෂයක් සඳහාම සියළුම වාහන සඳහා ආදායම් බලපත්‍ර ලබාගත යුතුය. නමුත්, භාවිතා කරනු ලබන වාහන 08 ක් සඳහා ආදායම් බලපත්‍ර 2018 වර්ෂය දක්වා ලබාගෙන නොතිබුණි. | වාහන සඳහා ආදායම් බලපත්‍ර අංක ලබාගැනීමට කටයුතු කළ යුතුය. | මේ සම්බන්ධයෙන් දැනට ක්‍රියාමාර්ග ගනු ලබමින් පවතී. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,366,600 ක් වූ අතර, ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 2,707,431 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා වූ ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| වරිපනම් හා බදු | 4,585 | 6,910 | 4,915 | 1,996 | 4,875 | 5,044 | 2,550 | 2,494 |
| කුලී | 1,470 | 2,861 | 916 | 1,945 | 2,210 | 819 | 819 | 819 |

සමාලෝචිත වර්ෂයේ බලපත්‍ර ගාස්තු පසුගිය වර්ෂයට වඩා රු.1,126,000 කින් වැඩි වී තිබුණි. මෙය බලපත්‍ර ගාස්තු අයකර ගැනීමේ මන්දගාමී තත්ත්වය පෙන්නුම් කරයි.

#### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභා බල පිහිටි නිශ්චල දේපල හඳුනාගෙන ඒවායේ වාර්ෂික | නිශ්චල දේපල හඳුනාගෙන එහි වටිනාකම තක්සේරු කර වරිපනම් බදු අයකිරීමට කටයුතු කළ යුතුය. | මේ සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතී. එසේ වුවත්, අවසන් වී නොමැත. |

| | | |
|---|---|---|
| වටිනාකම තක්සේරු කර වරිපනම් බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | | |

### 2.2.3 මස්කඩ බදු දීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මස් කඩ බදුකරුවන් බදු මුදල් ගෙවීම් පැහැර හැරීමේදී ඔවුන්ගේ ඇප තැන්පතුවලින් බදු වටිනාකම අයකර නොගෙන වර්ෂ අවසානයේදී මෙම ක්‍රියාවලිය සිදු කිරීම නිසා රු.7,273,843 ක හිඟ මුදල් අයකිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර තිබුණි. තවද, රු.7,098,912 ක හිඟ මුදල් සඳහා සභාව විසින් කාල විශ්ලේෂණයක් විගණනයට ඉදිරිපත් කර නොතිබූ බැවින් විගණනයේදී ශේෂය තහවුරු කළ නොහැකි වී තිබුණි. | කාල විශ්ලේෂණය ඉදිරිපත් කළ යුතු අතර හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | නිශ්චිත වූ ඇතැම් වර්ෂ සඳහා පමණක් විස්තර ලබාගත හැකිව තිබුණි. පසුගිය කාල විස්තර ලබාගත නොහැකිව තිබෙන නිසා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත නොහැකිව තිබේ. එම නිසා, මේ සම්බන්ධයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාගේ උපදෙස් ලබා කටයුතු කරනු ලැබේ. |

### 2.2.4 කුලී ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කච්චක්කොඩිතිවූ පොදු වෙළඳපොල බදු දීම | | |

| | | |
|---|---|---|
| පුර නැඟුම ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රතිපාදන යටතේ රු.21,510,853 ක පිරිවැයකට 2014 වර්ෂයේ ඉදිකළ පොදු වෙළඳපොල ගොඩනැගිලි සංකීර්ණයේ කඩ කාමර 36 ක් සහ විවෘත කඩ කාමර 32 ක් කින්නියා ප්‍රාදේශීය සභාව විසින් සතිපොළ කටයුතු සඳහා කඩයකින් රු.30,000 ක් ද විවෘත කඩ කාමරයකින් රු.20,000 ක් ද වශයෙන් එකතුව රු.1,720,000 ක් ආපසු ගෙවන තැන්පතු වශයෙන් අයකළ යුතුය. එසේ වුවත්, මේ දක්වා රු.593,000 ක් පමණක් සභාව අයකර ගෙන තිබුණි. | කඩ කාමර බදු දීමේදී අයකළ යුතු ආපසු ගෙවන තැන්පතු සම්පූර්ණයෙන් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | මේ සම්බන්ධයෙන් සභාව විසින් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |

### 2.2.5 මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 ජනවාරි සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ලැබිය යුතු මුද්දර ගාස්තු ගණනය කර ඒවා ලබාගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | මුද්දර ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතුය. | 2018 වර්ෂයට අදාළ මුද්දර ගාස්තු ගණනය කිරීම් දැනට අවසන් වී ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

නගර සභා ආඥා පනතේ 4 වැනි වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුබසාධනය යන කාර්යයන් සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) අපේක්ෂිත ප්‍රතිඵල ලබා කරගැනීමට නොහැකි වීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2011 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා සභාව විසින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම සඳහා රු.27,272,144 ක් වැයකර තිබුණි. නමුත්, සභාව විසින් එකතු කරනු ලබන කසළ වෙන් නොකර එම ප්‍රදේශයේ බැහැර කරමින් පවතී. තවද, කසළ පොහොර නිෂ්පාදනයට අවශ්‍ය යන්ත්‍ර සභාව සතුව නොතිබීමෙන් එම ක්‍රියාවලිය මේ දක්වා ආරම්භ කර නොතිබුණි. මේ නිසා අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීමට නොහැකි තත්ත්වයක් මතු වී තිබුණි. | කසළ වෙන්කර පොහොර නිෂ්පාදනයට කටයුතු කළ යුතුය. | දැන් කසළ වෙන්කිරීම් පවත්වාගෙන ඇති අතර යන්ත්‍ර ලබාගැනීමේ කටයුතු ද දැනට කෙරීගෙන යයි. |

(ආ) පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2000 අංක 53 සහ 1988 අංක 56 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ ප්‍රසිද්ධ කරනු ලැබූ අංක 1553/16 දරන 2008 ජනවාරි 25 දිනැති ගැසට් පත්‍රයේ දැන්වීම අනුව මධ්‍යම පරිසර අධිකාරියෙන් බලපත්‍ර ලබානොගෙන සත්ව ඝාතකාගාර පවත්වාගෙන යනු ලැබේ. තවද, මෙහි ඝාතනය කරනු ලබන සත්ව රුධිරය ඝන අපද්‍රව්‍ය අදාළ පිහිටි ගංඟාවට මිශ්‍රවන නිසා පරිසරය දූෂණය වීමට ඉඩ සැලසී ඇත. | පරිසර අධිකාරියේ අනුමැතිය ලබා නිසි අයුරින් අපද්‍රව්‍ය බැහැර කිරීමට කටයුතු කළ යුතුය. | දැනට Seylan Farm ආයතනය සමඟ නව සත්ව ඝාතකාගාරය පිහිටුවීම සඳහා ගිවිසුම් අත්සන් කර ඇත. ඉදිරි කාලයේදී දැනට භාවිතයේ තිබෙන සත්ව ඝාතකාගාරය වසා දැමීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

(ඇ) තිරසාර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනතේ ප්‍රකාරව එහි අරමුණු හා ඉලක්ක සභාව විසින් හඳුනාගෙන නොතිබුණි. තවද, 2030 වර්ෂයේ ළඟා කරගත යුතු තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සභාව සකස් කර ඒ පිළිබඳව ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සභාවට අදාළ තිරසාර සංවර්ධන ඉලක්කයන් හඳුනාගෙන ඒවා ළඟා කරගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සභාව විසින් ගත යුතුය. | මේ පිළිබඳව සභාව විසින් කටයුතු දැනට කෙරීගෙන යනු ලැබේ. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2008 සිට 2013 කාලපරිච්ඡේදය සඳහා වූ සභා සේවකයින්ගේ විශ්‍රාම දායක මුදල් ප්‍රේෂණය කිරීම සඳහා සභාව විසින් කටයුතු කර නොතිබුණි. රු.548,523 ක මුදලක් වැන්දඹු හා අනත්දරු අරමුදලට ප්‍රේෂණය කර නොතිබුණි. | විශ්‍රාම දායක මුදල් අදාළ අරමුදලට යැවීමට කටයුතු කළ යුතුය. | මේ පිළිබඳව සභාව විසින් කටයුතු දැනට කෙරීගෙන යනු ලැබේ. |
| (ආ) | 2015 මැයි 20 දිනැති අංක 11/2015 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 05 වගන්තිය ප්‍රකාරව රජයේ කාර්යාලවල කෑම විවේකය විනාඩි 30 ක් පමණි. මෙයට පටහැනිව සභාවේ සේවය කරන සේවකයින් විනාඩි 30 සිට පැය 2.30 කට අධික කාලයක් දිවා ආහාර විවේකය ලබාගැනීම නිරීක්ෂණය විය. මේ නිසා චක්‍රලේඛයට අනුව ඔවුන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීම ආයතන ප්‍රධානියාගේ වගකීම වේ. | ඉදිරි කාලයේදී මෙවැනි දෝෂ සිදු වූ විට අදාළ ක්‍රියාමාර්ග ගත යුතු අතර විගණන විමසුමේ සඳහන් කාලය ඉක්ම වූ කාරණාව සඳහා චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. | දිවා ආහාර විවේකය පිළිබඳව සියළුම නිලධාරීන් දැනුවත් කර ඇත. ඉදිරියේදී මෙවැනි දෝෂ සිදු වූ විට අදාළ නිලධාරීන්ගේ පෞද්ගලික අඩුකිරීමට කටයුතු කරනු ලබන බවට අවධාරණය කොට ඇත. |
| (ඇ) | අංක 03/2014(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සභාවේ ලේකම්වරයාට මාසිකව රු.2000 ක් සන්නිවේදන පහසුකම් සලසා දීම සඳහා 2015 ජනවාරි මාසයේ සිට ගෙවිය යුතු වුවද සභාවේ | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අදාළ ලේකම්වරයාට ලිපි මඟින් දැනුම් දී දින 14 ක් ඇතුළත රු.14,000 ක් අයකර ගැනීමට කටයුතු කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | ලේකම්වරයාට 2014 ජුනි මාසයේ සිට 2017 පෙබරවාරි මාසය දක්වා මාස 33 ක් සඳහා මසකට රු.2,000 බැගින් රු.66,000 ක් ගෙවා තිබුණි. ඒ අනුව 2014 ජුනි සිට 2014 දෙසැම්බර් දක්වා මාස 07 ක කාලයක් සඳහා රු.14,000 ක් වැඩිපුර ගෙවා තිබුණි. | | |
| (ඇ) | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ අංක 3/2017 දරන 2017 අප්‍රේල් 19 දිනැති චක්‍රලේඛයේ 4 වගන්තිය ප්‍රකාරව රජයේ සේවකයන්ගේ පැමිණීම සහ පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් තහවුරු කර ඒ පිළිබඳ වාර්තා සභාවේ තැබීමට කටයුතු කළ යුතු බවට සඳහන් වුවත් 2018 මාර්තු සිට මේ දක්වා එලෙස කටයුතු කිරීමට සභාව අපොහොසත් වී තිබුණි. | සභාවේ නිලධාරීන්ගේ පැමිණීම සහ පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් තහවුරු කිරීමට කටයුතු කළ යුතුය. | ඇඟිලි සලකුණු යන්ත්‍රය ක්‍රියා විරහිත වී ඇත. දැනට එය අලුත්වැඩියා කර ඇත. |
| (ඉ) | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අංක 20/2018 දරන 2018 අගෝස්තු 21 දිනැති චක්‍රලේඛයේ 4.5 ඡේදය ප්‍රකාරව මාසික මූලික වැටුප රු.43,480 කට වඩා වැඩිවීමේදී පමණක් වැටුප් සමඟ රු.1,000 ක් ලබාගත හැකිය. සභාවේ ලේකම්වරයාට 2018 අගෝස්තු මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා මූලික වැටුප රු.34,942 ක් වුවත්, රු.1,000 ක මුදල ඉල්ලීම් කර අංක | අදාළ ක්‍රියාමාර්ග ගෙන අයකළ යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | අදාළ ලේකම්වරයාට ලිපි මගින් දැනුම් දී දින 14 ක් තුළ රු.4,700 ක් අයකර ගෙන ඇත. |

407, 479, 495 සහ 569 දරන වවුචර් පත්වලින් රු.32,595 ක් ලබාගෙන තිබුණි. චක්‍රලේඛ ප්‍රකාරව රු.27,895 ක් ඔහුට ගෙවිය යුතුව තිබුණි. එසේ වුවත්, රු.4,700 ක් වැඩියෙන් ඉල්ලීම් කර ලබාගෙන තිබුණි.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxix පරිච්ඡේදයේ 4.4 වගන්තියේ නියම කර ඇති පරිදි, ණය බේරුම් කිරීමට ප්‍රථම නිලධාරීයෙකු මියගිය විට උරුමකරුවන්ට ලැබිය යුතු මුදල්වලින් ඒවා අඩු කර න ලෙස විශ්‍රාම වැටුප් අධ්‍යක්‍ෂගෙන් ඉල්ලා සිටිය යුතුය. එනමුත් සේවකයන් 07 දෙනෙකුගෙන් අයකළ යුතු රු.134,694 ක් සම්බන්ධයෙන් සභාව විසින් එපරිදි කටයුතු කර නොතිබුණි. | අවශ්‍යා ක්‍රියාමාර්ග ගෙන අයකළ යුතු වටිනාකම අයකිරීමට කටයුතු කළ යුතුය. | 2006 අප්‍රේල් 15 දින කින්නියා ප්‍රාදේශීය සභාව නගර සභාවක් ලෙස උසස් කළ අතර අලුතින් කින්නියා ප්‍රාදේශීය සභාව පිහිටුවන ලදී. කින්නියා ප්‍රාදේශීය සභාව ආරම්භ කිරීමට පෙර කාලයේ අයකළ යුතු රු.134,694 ක් හිඟ හිටව තිබුණි. |

### 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

### 3.4.1 වත්කම් කළමනාකරණය

#### 3.4.1.1 අයිතිය නොපැවරූ වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසර 2008 සිට 2016 තුළදී වෙනත් අමාත්‍යාංශ සහ ආයතන මඟින් සභාවට පරිත්‍යාග කරන ලද වාහන 05 ක අයිතිය ලබාගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. වර්තමානයේ මෙම වාහන සභාව විසින් භාවිතා කරමින් පවතියි. | සභාවට ලබා දී තිබූ සභාවේ නමට මාරු කිරීමට කටයුතු කළ යුතුය. | අයිතිය පැවරීමේ කටයුතු දැන් කෙරීගෙන යනු ලැබේ. |

#### 3.4.1.2 නිෂ්කාර්ය වත්කම්

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රු.1,000,000 ක පිරිවැයකට කොන්ත්‍රාත්කරුවකු විසින් ඉදිකරණු ලැබ, 2016 දෙසැම්බර් 31 දින භාරදෙනු ලැබූ මහජන වැසිකිළියක් භාවිතයෙන් තොරව පැවතිණි. | අදාළ ගොඩනැගිල්ල මහජන භාවිතය සඳහා යෙදවීමට කටයුතු කළ යුතුය. | ජල සම්පාදන හා මලාපවහන මණ්ඩලය විසින් නල ජල විස්තීරණයක් නොමැති හේතුවෙන් නළ ළිං (Tube well) ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් උපදෙස් ලබා කටයුතු කිරීමට අදහස් කර ඇත. |
| (ආ) | සභාවේ ඇති මෝටර් රථය, ත්‍රිරෝද රථ දෙක, පිකප් රථ දෙක යනාදිය වර්ෂ 03 සිට වර්ෂ 06 ක් දක්වා නිෂ්කාර්යව පැවති අතර අලුත්වැඩියා කර භාවිතා | අදාළ ක්‍රියාමාර්ග ගෙන විගණනයට දැනුම් දිය යුතු වේ. | වෙන්දේසියේ විකිණීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. |

කිරීමට හෝ වෙන්දේසියේ විකිණීමට හෝ කටයුතු කර නොතිබුණි.

### 3.5 ප්‍රසම්පාදනය

#### 3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2006 මාර්තු 24 දිනැති අංක 128 චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. | ඉදිරි කාලයේදී මේ සම්බන්ධයෙන් කටයුතු අප විසින් සිදු කරනු ලැබේ. |

#### 3.5.2 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | **කච්චක්කොඩිතීවූ මාළු වෙළඳපොල ගොඩනැගිල්ලට ජල සම්බන්ධතාවය ලබාගැනීම** | | |
| | කච්චක්කොඩිතීවූ මාළු වෙළඳපොල ගොඩනැගිල්ල ඉදිකිරීමේදී එම ගොඩනැගිලි ඉදිකිරීම් බිල් පත්‍ර යේ 2018 දෙසැම්බර් මාසයේ ජල සම්බන්ධතාවය ලබාගත්බව දන්වා රු.18,000 ක් කොන්ත්‍රාත්කරුට | වැඩිපුර ගෙවූ මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | කච්චක්කොඩිතීවූ මාළු වෙළඳපොලට අදාළ ඇප මුදල් තිබෙන නිසා වැඩියෙන් ගෙවූ රු.18,000 ක් ආපසු අයකිරීමට කටයුතු කරනු ලැබේත |

ගෙවා තිබුණි. නමුත් 2019 ජනවාරි 29 දින සභාව විසින්ම රු.25,155 ක් ගෙවා ජල සම්බන්ධතාවය ලබාගෙන තිබුණි. ඒ අනුව නොකළ කාර්යයන් සඳහා කොන්ත්‍රාත්කරුට රු.18,000 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

(ආ) සන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය ඉදිකිරීම

------------------------------

සන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන යටතේ රු.11,406,212 ක මුදලකට සන අපද්‍රව්‍ය රැස්කිරීමේ මධ්‍යස්ථානය වටා තාප්පය සහ කටුකම්බි වැටක් ඉදිකිරීම සහ විදුලි ලාම්පු සවිකිරීම සඳහා 2017 සැප්තැම්බර් 07 දින සභාව ගිවිසුමකට එළඹ තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

| | | | |
|---|---|---|---|
| (1) | විදුලි පහන් සවිකිරීම සඳහා කොන්ක්‍රීට් කණු භාවිතා කළ යුතු නිසා රු.150,000 ක් ඇස්තමේන්තු කර තිබුණි. එසේ වුවත්, කොන්ක්‍රීට් කණු භාවිතා නොකර GI Pipe මඟින් විදුලි පහන් සවිකර තිබුණි. | වගකිව යුතු නිලධාරින් සමඟ සාකච්ඡා කොට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | ලංකා විදුලිබල මණ්ඩලය සමග සාකච්ඡා කර විදුලි කණු ලබාගැනිමේ අදහසින් ඇස්තමේන්තු පිළියෙල කර ඒවා ලබාගැනීම සඳහා ඉල්ලීම් සිදු කර තිබුණත් ඒවා නොලැබීමෙන් හා අදාල කාර පරාසය තුළ කර්මාන්තය අවසන් කළ යුතු නිසාත්, තවද සඳහන් ඉඩ |

| | | |
|---|---|---|
| | | ප්‍රමාණය විශාල නිසාත්ව විදුලි බල මණ්ඩලයට කොන්ක්‍රිට් කණු සෑදීම සඳහා සාමාන්‍යයෙන් 04ක් පමණක් ලබාගත හැකි බැවින් GI Pipe 11ක් සවිකර තිබුණි. ඉදිරි කාලයේදී මෙවැනි ආකාරයේ වෙනස්වීම් සිදු නොවන අයුරින් කටයුතු කරනු ලැබේ. |

## 3.6 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ 2011 ජනවාරි සිට දෙසැම්බර් දක්වා රාජකාරී කළ සේවකයන් 13 දෙනෙකුට අර්ථසාධක අරමුදලේ දායක මුදල් රු.462,112 ක් ද 2012 ජනවාරි සිට 2013 අගෝස්තු දක්වා සේවය කළ සේවකයන් 16 දෙනෙකු සඳහා සේවක අර්ථසාධක දායක අරමුදල් රු.748,864 අදාළ කාලසීමාව තුළ ගෙවීමට අපොහොසත් වූ බැවින් දඩ ගාස්තු ලෙස රු.540,770 ක් සභාව ගෙවා තිබුණි. | කාල ප්‍රමාදයට හේතු වූ නිලධාරියා හඳුනාගෙන අවශ්‍ය කටයුතු කළ යුතුය. | මෙම කරුණු සම්බන්ධයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාගේ උපදෙස් ලබා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. |